# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,073 - 2018 මැයි මස 25 වැනි සිකුරාදා - 2018.05.25

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)


## IV (අ) වැනි කොටස - පළාත් සභා

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... ... | — | අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — |
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | — | තනතුරු ඇබෑර්තු ... ... ... ... | — |
| වෙනත් පත්කිරීම් ... ... ... ... | — | විභාග විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | |
| පළාත් සභා නිවේදන ... ... ... ... | 964 | ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... ... | — |
| | | බඩු බාහිරාදිය විකිණීම් ... ... ... ... | — |
| | | තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... | — |
| | | විවිධ දැන්වීම් ... ... ... ... | — |


*සැ. යු.* - සාපරාධී කාරණාවල දී අන්‍යෝන්‍ය සහයෝගීතාව දක්වීමේ (සංශෝධන) පනත් කෙටුම්පත 2018 මැයි මස 18 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර (එනම්, 2018 ජූනි මස 14 වැනි දින පළ කරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2018 ජූනි මස 01 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති (*වැ. බ.*)

2018 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# පළාත් සභා නිවේදන

**වයඹ පළාත් සභාව**

1946 අංක 57 දරන පොදු සුසාන සහ පුද්ගලික සුසාන පිළිබඳ ආඥාපනතේ II පරිච්ඡේදයේ 5 (I) යටතේ කරනු ලබන දැන්වීම

1989 අංක 12 දරන පළාත් සභා (අනුශාංගික විධිවිධාන) පනතේ දෙවැනි වගන්තියේ (II) වන උප වගන්තියේ (අ) ඡේදයේ සමග කියවිය යුතු 1946 අංක 57 දරන පොදු සුසාන සහ පුද්ගලික සුසාන භූමි පිළිබඳ ආඥාපනතේ II පරිච්ඡේදයේ 5 (1) වගන්තිය අනුව පළාත් සභාවේ පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා වන දසනායක ගුණරත්න බස්නායක මුදියන්සේලාගේ ධර්මසිරි දසනායක වන මා විසින් වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ අලව්ව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි පහත උපලේඛනයෙහි සඳහන් සුසාන භූමි මළමිනී වැළලීම හෝ ආදාහනය කිරීම පිණිස පොදුන සුසාන භූමි ලෙස මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

දසනායක ගුණරත්න බස්නායක මුදියන්සේලාගේ ධර්මසිරි දසනායක,<br>
වයඹ පළාත් ප්‍රධාන අමාත්‍ය හා මුදල් ක්‍රම සම්පාදන, ඉංජිනේරු සේවා,<br>
නීතිය හා සාමය, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන,<br>
ආර්ථික ප්‍රවර්ධන, පරිසර කටයුතු, ජල සම්පාදන හා ජලාපවාහන<br>
සහ සංචාරක කටයුතු අමාත්‍ය,<br>
වයඹ පළාත් සභාව.

2018 අප්‍රේල් මස 11 වැනි දින,<br>
කුරුණෑගල ප්‍රධාන අමාත්‍ය කාර්යාලය.

**උපලේඛනය**

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, අලව්ව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අලව්ව දකුණ ග්‍රාම නිලධාරි වසමේ, අලව්ව නගරයේ පිහිටි රූඩ් 01, පර්චස් 39ක් වූ ප්‍රමාණයෙන් උතුරට : අ: ග: පි: 463 කැබලි අංක 96 බී, නැගෙනහිරට : එම කැබලි අංක 96 ඩී, සහ 96 ඩී, දකුණට : එම කැබලි අංක 96 ඩී, බස්නාහිරට : පරමාඋල්ල ගම් මායිම් : අ: ග: පි: 468 මායිම් තුළ පිහිටි දවටගොල්ල කැරකොප්පුව නමැති ඉඩම.

05-753

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.